# මූලමධ්‍යමකකාරිකාවේ ඇතුළත් සුත්තනිපාතයේ ඉගැන්වීම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

මැදවච්චියේ සංඝානන්ද හිමි[1]

## හැඳින්වීම

මාධ්‍යමික සම්ප්‍රදාය යනු මහායාන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ගුරුකුලයකි. ආචාර්ය නාගාර්ජුනපාදයන් විසින් ආරම්භ කරන ලද මෙම සම්ප්‍රදායේ මුඛ්‍ය ග්‍රන්ථය ලෙස මූලමධ්‍යමකකාරිකාව පෙන්වා දිය හැකි ය. ආචාර්ය නාගාර්ජුනපාදයන් විසින් රචිත මෙම ග්‍රන්ථයේ මාධ්‍යමිකයන්ගේ මූලික ඉගැන්වීම් පිළිබඳ සවිස්තරයක් දැක ගත හැකි ය. කාරිකාව පරිච්ඡේද 27ක් තුළ බෙදී ගිය පද්‍ය 448කින් යුත් රචනයකි. එහි සෑම පරිච්ඡේදයක් ම 'පරීක්ෂා' යනුවෙන් නම් කොට ඇත (තිලකරත්න, 2020). මෙය මාධ්‍යමික සම්ප්‍රදායේ මූලික ම ඉගැන්වීම ලෙස සැලකෙන ශූන්‍යතාවාදයේ හෘදය ලෙස සලකනු ලැබේ (ධම්මනිසන්ති හිමි, 2019: 57).

මුල් බුදුසමයට අයත් ඉපැරණිතම බුද්ධ දේශනා ඇතුළත් කෘතියක් වශයෙන් සුත්ත නිපාතය හැඳින්විය හැකි ය. සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ පහළොව අතරින් පස්වෙනි ග්‍රන්ථය සේ සැලකෙන මෙහි ගද්‍යමය හා පද්‍යමය දේශනා මගින් ඉතා ගැඹුරු වූත්, එසේ ම අතිශයින්ම වැදගත් වූත් ධර්ම කරුණු ඇතුළත් සූත්‍රාන්තයන් සම සැත්තෑවක් අඩංගු වී ඇත. සුත්ත නිපාතයෙහි අවසන් වර්ග දෙක වන අට්ඨක හා පාරායන වර්ග දෙකෙහි අඩංගු සූත්‍ර දාර්ශනික වශයෙන් බුදුදහම පිළිබඳ ව හදාරන්නෙකුට ඉතා වැදගත් සූත්‍ර ඇතුළත් වර්ග දෙකක් ලෙස පෙන්වා දිය හැකි ය (සෝරත හිමි, 2017: 107).

මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන්නේ සුත්ත නිපාතයේ දෘෂ්ටි පිළිබඳ ඉගැන්වීම් මූලමධ්‍යමකාරිකාවේ දැක ගත හැකි ද යන්නයි. මහාචාර්ය අසංග තිලකරත්න මහතා විසින් 2001 වර්ෂයේ දී රචිත ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය යන කෘතියෙහි මූලමධ්‍යමකාරිකාව පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු දැක ගත හැකි ය. විශේෂයෙන් ම මෙම ග්‍රන්ථය මූලමධ්‍යමකාරිකාව සිංහලයට පරිවර්තනය කොට ඒ පිළිබඳ ව අර්ථ විවරණයක් සපයා ඇති නමුත් එහි සුත්ත නිපාතයේ ඉගැන්වීම් ඇති බවට තොරතුරු සපයා නොමැත. මහාචාර්ය ඩේවිඩ් කලුපහන විසින් 1991 වර්ෂයේ රචිත Mūlamadhyamakakārikā of Nāgārjuna නම් ග්‍රන්ථයෙහි ද දැක ගත හැකි වන්නේ මූලමධ්‍යමකකාරිකාවේ ඉංග්‍රීසි පරිවර්තනය හා එම ග්‍රන්ථය පිළිබඳ ව දක්වා ඇති අර්ථ විවරණය පමණි. මෙහි ද සුත්ත නිපාතයේ ඉගැන්වීම් ඇති බවට තොරතුරු සපයා නොමැත. 2019 වර්ෂයේ ප්‍රකාශිත මහායාන මීමංසා නම් සඟරාවට නාගාර්ජුනපාදයන් හා මූලමධ්‍යමකකාරිකාව යන මාතෘකාව යටතේ ඒකල ධම්මනිසන්ති හිමියන් පර්යේෂණ පත්‍රයක් ඉදිරිපත් කර ඇත. එහි ද දක්නට ඇත්තේ මූලමධ්‍යමකකාරිකාව පිළිබඳ තොරතුරු පමණි.

1. තාවකාලික නිබන්ධ උපදේශක (හිටපු), බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය. msangananda123@gmail.com

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ සුත්ත නිපාතයේ අට්ඨක හා පාරායන වග්ගයේ ඇති දෘෂ්ටි විචාරය පිළිබඳ ඉගැන්වීම් මූලමධ්‍යමකකාරිකාවේ අවසන් පරිච්ඡේදය වන දෘෂ්ටි පරීක්ෂා තුළ ඇති බව පෙන්වාදීමයි. සුත්ත නිපාතයේ අට්ඨක හා පාරායන වර්ග දෙකත්, මූලමධ්‍යමකකාරිකාවේ දෘෂ්ටි පරීක්ෂා යන පරිච්ඡේදයත් මෙම පර්යේෂණයේ පර්යේෂණ සීමාවන් වන්නේ ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රයයන් මගින් දත්ත එක් රැස් කර, එම දත්ත විශ්ලේෂණය කර මෙම පර්යේෂණය සිදු කරනු ලැබේ.

**සාකච්ඡාව**

මාධ්‍යමික සම්ප්‍රදාය අනුගමනය කරන දර්ශනය ශූන්‍යතාවාදයයි. එහි ශූන්‍යතාවයෙන් ඉදිරිපත් කරන්නේ යම් කිසිවක් 'ඇත' යන අර්ථයෙන් නොගෙන, සියල්ල ඇති වීම අන්යෝන්‍ය සම්බන්ධය මත සිදුවන්නේ යැයි පිළිගැනීම යි (ගමගේ, 2014). ශූන්‍යතාවය පදනම් කරගත් හෙවත් ශූන්‍යතාවය ප්‍රකාශ කෙරෙන ප්‍රතීත්‍යසමුප්පාද දර්ශනයක් වේද, එය මාධ්‍යමික නම් වෙයි.

යඃ ප්‍රතීත්‍යසමුත්පාදඃ - ශූන්‍යතාං තාං ප්‍රචක්ෂ්මහෙ

සා ප්‍රඥප්තිරුපාදාය - ප්‍රතිපත් සෛව මධ්‍යමා (Kalupahana, 2015: 339).

මෙලෙස ආචාර්ය නාගාර්ජුනපාදයන් ශූන්‍යතාවාදය බිහිකිරීම සඳහා මුල් බුදුදහමේ මූල බීජ කරගත් සූත්‍රයක් ලෙස සුත්ත නිපාතයේ පාරායන වර්ගයේ මෝඝරාජ සූත්‍රය පෙන්වා දිය හැකි ය. මෙහි දී මෝඝරාජ නම් තරුණයා විසින් බුදුන් වහන්සේගෙන් විමසා සිටින්නේ මාරයාට නොපෙනී සිටින්නටනම් කුමන අයුරකින් ලෝකය දෙස බැලිය යුතු ද යන්නයි. එවිට බුදුන් වහන්සේ දේශනා කර සිටියේ සක්කාය දෘෂ්ටිය දුරු කොට ලෝකය ශූන්‍ය සේ බලන පුද්ගලයා මාරයාට නොපෙනී සිටින බව ය.

සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු මොඝරාජ සදා සතො, අත්තානුදිට්ඨිං ඌහච්ච එවං මච්චුතරො සියා; එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සතීති. (සුත්තනිපාත, 344).

යථෝක්ත කාරණය අවධාරණය කරමින් ආචාර්ය නාගාර්ජුනපාදයන් සඳහන් කරන්නේ ශූන්‍යතාව වනාහි සියලු දෘෂ්ටීන්ගේ මිදීම බව බුදුන් වහන්සේ විසින් ප්‍රකාශ කොට ඇති බව ය. යමෙකුට ශූන්‍යතාව දෘෂ්ටියක් වේ ද ඔවුන් සුව කළ නොහැකි බව යි.

ශූන්‍යතා සර්වදෘෂ්ටීනාං - ප්‍රොක්තා නිඃසරණං ජිනෛඃ

යෙෂාං තු ශූන්‍යතා දෘෂ්ටිස් - තානසාධ්‍යාන් බභාෂිරෙ (Kalupahana, 2015: 223).

ආචාර්ය නාගාර්ජුනපාදයන් මූලමධ්‍යමකකාරිකාව අවසන් කරනුයේ යම් තථාගතයන් වහන්සේ කෙනෙක් අනුකම්පාව උපදවා සියලු දෘෂ්ටි ප්‍රහාණය කිරීම පිණිස සද්ධර්මය දේශනා කළ සේක් ද, මම ඒ ගෙතමයන් වහන්සේට නමස්කාර කරමි යනුවෙනි.

සර්වදෘෂ්ටිප්‍රහාණාය - යඃ සද්ධර්මමදේශයත්

අනුකම්පාමුපාදාය - තං නමෂ්‍යාමි ගෞතමම් (Kalupahana, 2015: 390).

මෙම සියලු ප්‍රකාශවලින් පැහැදිලි වන්නේ කිසිදු දෘෂ්ටියක එල්බ ගැනීම නාගාර්ජුනයන් ප්‍රිය නොකළ බව යි. ශූන්‍යතාව පිළිබඳ අවබෝධයක් නැත්නම් කිසිදු දෘෂ්ටියක් දුරු කළ නො හැකි ය. දෘෂ්ටි මත ආදානග්‍රාහී ලෙස පිහිටා සත්වයා හා ලෝකය පිළිබඳ ව යම් යම් දෘෂ්ටිවාදවලට එළඹීම වූකලී මුග්ධ ක්‍රියාවකි. ඊට හේතුව ශාස්වත හා උච්ඡේද දෘෂ්ටිවලින් කියවෙන්නේ අර්ධ සත්‍යයක් නිසාවෙනි. සියල්ල හෙවත් සියලු ධර්ම නිරන්තර වෙනස්වීමට භාජනය වන බව බුදුදහමේ ස්ථාවරයයි. එම නිසා ශාස්වතවාදීන් ආත්මය හා ලෝකය සදාතනිකය යන අදහස දැරීමත්, උච්ඡේදවාදීන් මරණින් පසු සියල්ල අභාවයට පත්වේ යැයි සිතීමත් මිථ්‍යා දෘෂ්ටීන් විය. එම නිසාවෙන් බුදුන් වහන්සේ එම මිථ්‍යා දෘෂ්ටීන් දෙකෙන් ම නිදහස් වූ බව පැවසෙන ප්‍රකාශ සූත්‍ර සාහිත්‍යයේ දැක ගත හැකි ය.

සුත්තනිපාතයේ ජරා සූත්‍රය මෙන් ම දුට්ඨට්ඨක සූත්‍රය ද නියම මුනිවරයාගේ ලක්ෂණ පෙන්වා දෙයි. දිය බුඳු නෙළුම් පතෙහි නො තැවරෙන්නාක් මෙන් මුනිවරයා ද දිට්ඨ, සුත, මුත ආදි කිසිවක නො බැඳී සිටියි. කිසිවක් කෙරේ බැඳීමක් හෝ ද්වේශයක් නො උපදවන හෙතෙම ප්‍රියත්වය සිහිනයක් සේ දකියි. එකී මුනිවරයා උසුලන දෘෂ්ටිමය ස්වභාවය පිළිබඳ මාගන්ධිය සූත්‍රයේ ද වැදගත් කරුණු රාශියක් අනාවරණය වේ. මේ සූත්‍රය අනුව මුනිවරයා යන්නෙන් බුද්ධ මුනිවරයා ම අදහස් වේ. මහායානයේ ඒක යානය හෙවත් බුද්ධ යානය ම ප්‍රධාන බව ප්‍රසිද්ධ කරුණකි.

සුත්තනිපාතයේ අට්ඨක වග්ගයේ දුට්ඨට්ඨක, සුද්ධට්ඨක, පරමට්ඨක, මාගන්දිය, පසූර, කලහවිවාද, චූලවියූහ, මහාවියූහ හා අත්ථදණ්ඩ යන සූත්‍ර දෘෂ්ටි සංකල්ප ආදි වාද විවාදවලින් මිදීම අරමුණු කරගෙන පුද්ගලයාට උපදෙස් දීමට දේශනා කෙරී ඇත. ආචාර්ය නාගාර්ජුනපාදයන් ග්‍රන්ථය ආරම්භ කරනුයේ ප්‍රතීත්‍යසමුප්පාදය දේශනා කළ බුදුරදුන්ට නමස්කාර කරමිනි. එහෙත් එතුමා ග්‍රන්ථය අවසන් කරන්නේ සියලු දෘෂ්ටි ප්‍රහාණය කළ බුදුරදුන්ට නමස්කාර කරමිනි. මේ තුළින් පැහැදිලි වන්නේ නාගාර්ජුනපාදයන් ප්‍රතීත්‍යසමුත්පාදය පදනම් කරගෙන ශූන්‍යතාවාදය ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වූයේ සියලු දෘෂ්ටි ප්‍රහාණය යි. බුදුසමයට අනුව සියලු දෘෂ්ටි ඇතිවීමට බලපාන මූල සාධකය වන්නේ ආත්ම දෘෂ්ටියයි. මෙම ආත්ම දෘෂ්ටිය පදනම් කරගෙන බිහි වූ සෑම දෘෂ්ටියක් ම ශාස්වත හා උච්ඡේද යන දෘෂ්ටි දෙකෙන් එක් දෘෂ්ටියකට අයත් විය. නාගාර්ජුනපාදයන් මූලමධ්‍යමකකාරිකාවේ අවසන් පරිච්ඡේදය වන දෘෂ්ටි පරීක්ෂාවේ දී සිදු කර ඇත්තේ ආත්ම දෘෂ්ටිය ප්‍රහාණය කිරීමයි. නාගාර්ජුනපාදයන් ප්‍රශ්න කරනුයේ සියල්ල ශූන්‍ය බැවින් ශාස්වත ආදි දෘෂ්ටිවලින් කවරක්, කොහිදී, කුමක් හෙයින්, කවරෙකුහට නම් ඇතිවේද යනුවෙනි.

අථවා සර්වභාවානාං - ශූන්‍යත්වාච්ඡාශ්වාතාදයඃ

ක්ව කස්‍ය කතමාඃ කස්මාත් - සම්භවිෂ්‍යන්ති දෘෂ්ටයඃ (Kalupahana, 2015: 390).

නාගාර්ජුනපාදයන්ගේ දර්ශනය, ක්‍රමය විද්‍යාව හා ඉතා සමීප වෙයි. එහි දී අදාළ සංකල්පවල අස්ථිත්වය ප්‍රතික්ෂේප කර නාස්ථිත්වය පෙන්වීම උන්වහන්සේ සිදු

නොකරයි. ඇත හා නැත යන අන්ත දෙකෙන් ම තොර බව මෙහි දී විශද කරයි. බුදුන් වහන්සේ ද අන්තයන්ගෙන් බැහැරව ධර්මය දේශනා කළ බව දැක ගත හැකි ය. අට්ඨක වර්ගයට අයත් දුට්ඨට්ඨක සූත්‍රයෙහි නියම මුනිවරයා කිසිඳු දෘෂ්ටියක් ඇසුරු නො කරන්නෙක් බවත්, පටු අදහස් දියුණු නො කරන්නෙක් බවත් එහි සඳහන් වේ.

වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ - අථොපි වෙ සච්චමනා වදන්ති

වාදඤ්ච ජාතං මුනිනො උපෙති - තස්මා නත්‍ථි බීලො කුහිඤ්චි (සුත්තනිපාත, 246).

සුද්ධට්ඨක සූත්‍රයෙහි සඳහන් වන පරිදි කිසියම් දෘෂ්ටියක් තුළින් ඇතිවෙන ඥානයෙන් නිර්වාණය ලැබිය නො හැකි ය. එහෙත් විදර්ශනා ප්‍රඥාව තුළින් ඇති කරගනු ලබන අනුපාදානයෙන් හෙවත් නො ඇලීමෙන් එය ලබා ගත හැකි ය. කිසිම දෘෂ්ටියක් කෙනෙකුට නිර්වාණාධිගමය සඳහා මග නො කියයි. මේ ලෝකයෙහි ඇතැමුන් මතවාදයක එල්බ ගැනීම ප්‍රඥාව ලෙස දැකීමත්, ඔහු සෙසු අය අතර සුවිශේෂී උසස් පුද්ගලයකු ලෙස සම්මත වීමත් ඛේදයකි. නමුත් දෘෂ්ටිය විසින් කෙනෙකු ඥාන පරිපූර්ණත්වයකට හෝ පාරිශුද්ධියට පත් නොකරන බව බෞද්ධ දාර්ශනික සිද්ධාන්තය වේ. මෙනයින් බලන කල සුත්ත නිපාතයේ අට්ඨක හා පාරායන වර්ගවල මූලමධ්‍යමකකාරිකාවේ ඉගැන්වීම්වල මූල බීජ අන්තර්ගත වන බව ඉතා පැහැදිලිය. නාගාර්ජුනපාදයන් මෙම ඉගැන්වීම් ආශ්‍රය කොට ගෙන සිය මතවාද දියුණු කළ බව කිව හැකි ය.

**නිගමනය**

යථෝක්තව සඳහන් කරන්නට යෙදුනු කරුණුවලට අනුව ගම්‍යමාන වන්නේ බුදුන් වහන්සේ මංගල ධර්ම දේශනාවේදී සියලු දෘෂ්ටීන් මුල් කොට පවතින්නා වූ ශාස්වත හා උච්ඡේද දෘෂ්ටීන් දුරු කලේ යම් අයුරකින් ද, එපරිද්දෙන් ආචාර්ය නාගාර්ජුනපාදයන් මූලමධ්‍යමකකාරිකාව නැමැති සිය කෘතිය තුළින් නව අරුතකින් සියලු දෘෂ්ටි ප්‍රහීණ කර ඇති ආකාරයයි. එසේ ම ඒ සඳහා උන්වහන්සේට අපරිමිත අවශ්‍යතාවයක් තිබූ බව ග්‍රන්ථයේ අවසාන ශ්ලෝකයෙන් විශද වේ. බොහෝ උගතුන්ගේ මතයට අනුව සුත්ත නිපාතයේ අට්ඨක හා පාරායන වර්ග දෙක වනාහි කිසිදු වෙනස්වීමකට භාජනය නොවූ, පෞරාණිකත්වයකින් හෙබි සංග්‍රහයකි. එහි ඇති පෞරාණිකත්වයට හානි නො කරමින්, නව අරුතක් සපයමින් නාගාර්ජුනපාදයන් සියලු දෘෂ්ටි ප්‍රහීණ කර ඇති ආකාරය අවසාන පරිච්ඡේදයෙන් දැක ගත හැකි ය. එම පරිච්ඡේදය තුළින් පුද්ගලවාදීන්ගේ භව සංක්‍රමික පුද්ගලයකු ඇතැයි යන සංකල්පය ද ඛණ්ඩණය කර ඇති ආකාරයක් දැක ගත හැකි ය. එමෙන් ම මහායාන බුදුදහම බිහිවීමෙහිලා ආදි බෞද්ධ මූල බීජ පදනම් වූ බව ද මෙම පර්යේෂණයෙන් විශද වෙයි.

**මුඛ්‍ය පදඃ** අට්ඨක වර්ගය, ආචාර්ය නාගාර්ජුනපාදයන්, දෘෂ්ටි, පාරායන වර්ගය, මූලමධ්‍යමකකාරිකාව

**ආශ්‍රිත ග්‍රන්ථ**

*සුත්තනිපාතය.* (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ගමගේ, එස්. අයි. (2014). *මහායාන ථේරවාදී බෞද්ධ දර්ශනය*. වරකපොල: ආරිය ප්‍රකාශකයෝ.

තිලකරත්න, අසංග. (2020 තෙවන මුද්‍රණය). *ශුන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය*. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ධම්මනිසන්ති හිමි, ඒකල. (2019). 'නාගාර්ජුනපාදයන් සහ මූල මාධ්‍යමික කාරිකාව'. *මහායාන මීමංසා*. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ, 57-70.

සෝරත හිමි, වැලිවිට. (2017). 'සුත්ත නිපාතයේ අට්ඨක වග්ගයේ සූත්‍රවලින් පිළිබිඹු වන කාමයෙහි ආදීනව'. *ප්‍රවචන*, කලාපය 8 (2), 106-122.

Kalupahana, D. J (2015 6th reprint). *Mūlamadhyamakakārikā of Nāgārjuna*. Delhi: Motilal Banarsidass Publishers Private Limited.